**<u>ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පවත්වන සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙලට අදාළ</u>**

**<u>කොන්දේසි මාලාව 2017-2018</u>**

(කොන්දේසි මාලාව මෙම වසර සඳහා සංශෝධනය කර ඇත)

1.0 සිකුරාදා දිනවල පහත සඳහන් වෙලාවන් තුළ පන්ති පැවැත්වෙනු ඇත.

- හතර (4) සිට අට (8) වසර දක්වා පන්ති - පෙ.ව 7.55 සිට දහවල් 11:15 දක්වා,
- දෙක (2) වසර සහ තුන (3) වසර පන්ති - දහවල් 11.55 සිට ප.ව 3:00 දක්වා,
- එක (1) වසර සඳහා පන්ති - ප.ව 3:40 සිට සවස 6:30 දක්වා.

ඉහත සඳහන් කාල වේලාවන් ට අනුකූලව දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම දෙමාපිය භාරකරුවන්ගේ වගකීමකි. **<u>ප.ව. 6:30 න් පසු</u>** කොන්සල් ජනරාල් කාර්යාලය සහ එම පරිශ්‍රයේ දරුවන් කිසි විටෙකදී රැඳී නොසිටිය යුතු අතර එසේ ගැවසෙන දරුවන්ගේ සම්පූර්ණ වගකීම දෙමාපියන් සතුවනු ඇත.

2.0 දහම්පාසලට දරුවකු ඇතුළු කිරීම සඳහා එම දරුවා 2017 දෙසැම්බර් මස 31 වැනිදාට වයස අවුරුදු හය (6) සම්පූර්ණ වී තිබිය යුතුය. එනම් 2011 දෙසැම්බර් මස 31 දින හෝ එදිනට පෙර උපන් දරුවෙක් විය යුතුය.

3.0 **2** වසර **3** වසර පන්ති සඳහා දරුවන් ඇතුළත් කිරීමක් සිදු **<u>නොකෙරෙන</u>** බව කරුණාවෙන් දැනුම් දෙමු.

4.0 හතර (4) වසර සහ ඉන් ඉහළ පන්ති වලට දරුවන් ඇතුළත් කිරීම සඳහා සිංහල, බුද්ධාගම සහ අපේ උරුමය විෂයයන් ආශ්‍රිතව සඳහා ලිඛිත සහ වාචික පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එයින් සමත්වන දරුවන් පමණක් දහම් පාසලේ කමිටුවේ අනුමැතිය මත පමණක් අදාල ඉහළ පන්තිවලට අනුගත කරනු ලැබේ. එම දරු දැරියන්ගේ වයස 2017 දෙසැම්බර් මස 31 වැනිදාට අවුරුදු නමය (9) සම්පූර්ණ වී තිබිය යුතුය.

5.0 පිරිමි දරුවන් කොණ්ඩය කොටට කපා මනාව පීරා, සුදු පැහැති ජාතික ඇඳුමෙන් සැරසිය යුතු වන අතර අත් කොට කමිස හෝ අනෙකුත් ඇඳුමින් සැරසී නොපැමිණිය යුතුය. ගැහැණු දරුවන් පිට සහ කර ප්‍රදේශයන්, නාභිය සහ උදරය මනාව වැසෙන සේ සකසන ලද සුදු පැහැති වාම් ළමා සාරියකින් සැරසී, කොණ්ඩය කරල් දෙකකට වනසේ ගොතා සුදු පැහැති රිබන් පටි වලින් මනා ලෙස බැඳ පාසලට පැමිණිය යුතු වේ.

6.0 අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා දරුවන් දිනපතා පාසලට පැමිණීම අත්‍යාවශ්‍ය වනු ඇත. අධ්‍යයන වසර ඇතුළත දහම් පාසල පැවැත්වෙන දින ප්‍රමාණයෙන් 70% කට වැඩියෙන් සහභාගී වන දරු දැරියන් හට පමණක් වර්ෂ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් විය හැකි බවත්, ඒ අනුව ඉහළ පන්තියට අනුගත කිරීම සිදු කෙරන බවද කරුණාවෙන් සලකන්න.

7.0 දැනුම් දීමකින් තොරව නොකඩවා දින තුනක් (3) පාසලට නොපැමිණෙන දරුවන් පාසල හැර ගියාසේ සලකනු ඇත. එම දරුවන් නැවත පාසලට ඇතුළත් කරවීමට අවශ්‍ය නම් මීළඟ පාසල් වාරයේදී අලුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.

8.0 පාසල නොපවත්වන දින, විශේෂ අවස්ථාවන් පිළිබඳව සහ වෙනත් පුහුණු කිරීම් කටයුතු, නිවේදන පිළිබඳව පූර්ණ දැනුම් දීමක් දෙමාපියන් වෙත කෙරෙනු ඇත. එවන් අවස්ථාවන් පිළිබඳව දැනුම් දීම සඳහා ඉල්ලුම් පත්‍රයේ සඳහන් දුරකථන අංක, අන්තර්ජාල ලිපිනයන් ප්‍රයෝජනයට ගන්නා අතර එම දත්තයන්ගේ වෙනස්වීම් නොපමාව සංවිධායක කමිටුව වෙත දැනුම් දීම දෙමාපියන්ගේ වගකීම වනු ඇත.

9.0 දූ දරුවන් වෙලාවට රැගෙන ඒම, රැගෙන යාම සහ වැඩසටහන් පැවැත්වෙන වේලාවන් තුළ කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රය තුළ හෝ ඒ අවට අනවශ්‍ය ලෙස ගැවසීමෙන් සහ රැස්වීමෙන් වැළකිය යුතුය.

10.0 දෙමාපියන් තමන්ගේ වාහන කොන්සල් ජනරාල් කාර්යාලයට යාබද මාර්ග වලට (අමුණුම 1) අවතීර්ණ නොකර වෙනත් නීත්‍යානුකූලව නතර කළ හැකි ස්ථානයක නවතා පාසලට දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම කළ යුතුය.

11.0 පදික වේදිකාව මත වාහනය නවතා හෝ ද්විත්ව නවතන (double parking) කොට දරුවා එනතෙක් සිටීම සපුරා තහනම් බව සැලකිය යුතුයි.

11.0 තම වාහන නැවත්වීමේදී කොන්සල් ජනරාල් කාර්යාල භූමිය අවට නිවැසියන් හට අවහිරයක්, අපහසුතාවයක් නොවන අයුරින් කටයුතු කළ යුතුය. දරුවන් වාහනයෙන් බැස්වීම හෝ නැංවීම සඳහා මාර්ගය අවහිර වනසේ වාහන නවත්වන අවස්ථාවන් හිදී ඒ පිළිබඳව ක්‍රියා කිරීමට අදාළ නිලධාරින් හට දැනුම් දී නීතිමය පියවර ගැනීමට සිදුවනු ඇත.

12.0 දහම් පාසල අසල සිසුන් හැසිරවීම, වාහන හැසිරවීම ආදියෙහි වගකීම දෙමාපිය කමිටුව සතු වන අතර තම වාහනය නිසි ලෙස නවතා දරුවන් රැගෙන ඒම / යාම සිදුකරමින් එම කටයුතු සඳහා දෙමාපියන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා දිය යුතුය.

13.0 දූ දරුවන්ට අවශ්‍ය පරිදි විවේක කාලයේදී අනුභවය සඳහා නිර්මාංශ සුළු ආහාරයක් සහ බීමක් සුදුසු ලෙස පාර්සල් කොට එවීම දෙමව්පියන් ගේ වගකීමක් වනු ඇත. එම පාර්සල් වල අනිවාර්යයෙන් දරුවාගේ නම සඳහන් කළ යුතුය.

14.0 දහම් පාසල මගින් පවත්වන විවිධ වැඩසටහන් වලට සහභාගී වන දූ දරුවන් ගේ ඡායාරූප, වීඩියෝ පට සහ හඬ පට විවිධ මාධ්‍යයන් ඔස්සේ දහම් පාසල මගින් ප්‍රචාරය කිරීම පිළිබඳව කිසියම් විරෝධයක් නොමැති විය යුතුයි.

15.0 දරුවාගේ සෞඛ්‍ය හෝ හැසිරීම් රටාව සම්බන්ධයෙන් දහම් පාසල දැනගතයුතු විශේෂ කරුණු (ආසාත්මිකතා - allergies, ආබාධිත තත්වයන් - special needs) වෙතොත් එය අදාල ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා සංවිධායක කමිටුව වෙත දැනුම්දිය යුතුයි.

16.0 දෙමව්පියන් දහම් පාසලට දරුවන් රැගෙන එන විට සුදුසු වාම් ඇඳුමකින් සැරසී පැමිණිය යුතුයි. සුදු පැහැති ඇඳුමකින් සැරසී දහම් පාසලට පැමිණීම වඩාත් සුදුසු බව සලකන්න

17.0 හැකිතාක් දුරට නිතර භාවිතා කරන පුද්ගලික විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයක් ලබාදීමට කටයුතුකළ යුතුය. මෙම ලිපිනයන් වෙත පණිවිඩ එවීම දහම් පාසලේ කමිටුවේ අධීක්ෂණය යටතේ සිදුකරන බව සලකන්න. දහම් පාසලේ සංවිධායක මණ්ඩලය විසින් සුදුසුයයි තීරණය කරන දහම් පාසලේ දැන්වීම් සහ බාහිර වැඩසටහන් පිළිබඳව දැන්වීම් ද මෙම ලිපිනයන් වෙත එවන අතර, බාහිර දැන්වීම් ලබාගැනීමට අවශ්‍ය නොමැතිනම් ඒ බව දැනුම් දෙන්න.

18.0 කොන්සල් ජනරාල් කාර්යාල භූමිය තුළ සහ අවට ප්‍රදේශය තුළ කිසිම ආකාරයක වෙළඳ ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීම හෝ ඒ හා සම්බන්ධ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීමෙන් වැළකිය යුතුය.

සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මගින් පනවා ඇති කොන්දේසි මාලාවට එකඟ වන බවටත්, දහම් පාසලේ දූ දරුවන් සහ දෙමාපියන් සඳහා පනවා ඇති විනය නීති මාලාව පිළිපදින බවටත්, ඉහත සඳහන් එක් කොන්දේසියක් හෝ කඩකරන පළමු අවස්ථාවේදීම දරුවාගේ දහම් පාසලේ ශිෂ්‍ය භාවය අහෝසි කිරීමට දහම් පාසලේ සංවිධායක මණ්ඩලයට සහ අනුබද්ධිත දෙමාපිය කමිටුවට පූර්ණ බලය ඇති බව පිළිගන්නා අතර කිසිම කාරණයක් මත දරුවා නැවත දහම් පාසලට ඇතුළත් කර නොගන්නා බවද පිළිගනිමි. තවද මෙම ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ සහ අනුබද්ධිත දෙමාපිය කමිටුවේ තීරණ අවසන් තීරණ බවද පිළිගනිමි.

මව / පියා / භාරකරුගේ නම: ..........................................................................................

දරුවාගේ නම: ..........................................................................................................

අත්සන:..............................................................          දිනය:...........................................

පහත දක්වා ඇති සිතියමේ කොන්සල් ජනරාල් කාර්යාලය අවට රතුපාටින් සටහන් කර ඇති පාරවල් වලට ඔබගේ දරුවන් රැගෙන එන හෝ රැගෙනයාමට පැමිණෙන වාහන ඇතුල් කිරීමෙන් වැලකී සිටිය යුතුය.

